**දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය - 2021**

දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා අන්තර්ජාතික සංවර්ධන සමායතනය අතර 2019 අප්‍රේල් 11 දින එළඹි අංක 6346-LK දරන ණය ගිවිසුමේ III (ii) වගන්තිය සහ මුදල් නිදහස් කිරීම් හා මූල්‍ය තොරතුරු ලිපිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය ගිවිසුම අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන අතර අන්තර්ජාතික සංවර්ධන සමායතනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.
තෝරාගත් සංවේදී ස්ථාන වල කුඩා වතු හිමියන්ගේ කෘෂිකර්මාන්තයේ ඵලදායිතාව සහ දේශගුණයට ඔරොත්තුදීමේ හැකියාව වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. කෘෂිකාර්මික නිෂ්පාදනය සහ අලෙවිකරණය, කෘෂිකර්මාන්තය සඳහා ජලය සහ ව්‍යාපෘති කළමනාකරණය යන සංරචක තුනක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 25,200කට සමාන වූ එජඩො මිලියන 140 වන අතර ඉන් රු. මිලියන 22,500 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 125 ක් සැපයීම සඳහා අන්තර්ජාතික සංවර්ධන සමායතනය සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 2700 ශ්‍රී ලංකා රජය සහ ප්‍රතිලාභීන් විසින් මූල්‍යනය කිරීමට බලාපෙරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2019 මැයි 07 දින ආරම්භ කරන ලද අතර, 2024 ජූනි 30 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

**1.3 මතය**

2021 දෙසැම්බර් 31 දිනට දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගනන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

**2.1 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 103 සහ 104 | අස්ථානගත වී ඇති වටිනාකම රු. 144,300 ක් වූ ලැප්ටොප් පරිගණකය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. | අදාල කරුණ සම්බන්ධයෙන් වාර්තාවක් ලබා ගැනීම සඳහා උතුරුමැද පළාතේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් කමිටුවක් පත්කර ඇති අතර එම වාර්තාව ලැබුණු පසු අවශ්‍ය පියවර ගැනීමට නියමිතය. | වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2009 අප්‍රේල් 16 සහ 2009 ජූනි 17 දිනැති අංක 09/2009 හා 09/2009 (1) දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයන් | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පැමිණීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිතාකර නොතිබුණි. | කාර්යමණ්ඩලයේ පැමිණීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මිලදී ගැනීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු කරමින් සිටී. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ඇඟිලි සලකුණු යන්ත්‍රය ස්ථාපිත කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ 34 වන වගන්තිය. | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ වගන්තිය අනුව කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) ස්ථාපිත කර නොතිබුණි. | කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම ප්‍රසම්පාදන අදියරේ පවතී. | කළමනාකරණ තොරතුරු පද්ධතිය ප්‍රමාදයකින් තොරව ස්ථාපිත කළ යුතුය. |
| (ඈ) | 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු (PSC) මාස දෙකකට වරක් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ පවත්වා ඇත්තේ ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් තුනක් පමණි. | කොවිඩ් තත්ත්වය යටතේ පවා 2021 වර්ෂයේ ජාතික ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් 03 ක් පවත්වා ඇත. | චක්‍රලේඛයේ දී ඇති උපදෙස් වලට අනුව ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් කාලානුරූපීව පැවැත්විය යුතුය. |
| (ඉ) | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ ඇමුණුම 2 හි 21 වන උප වගන්තිය, 2016 ජූනි 10 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය සහ අංක 1/2017 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | ව්‍යාපෘතිය විසින් අභ්‍යන්තර විගණකවරයෙකු බඳවාගෙන නොමැති අතර සමාලෝචිත වර්ෂය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | ව්‍යාපෘතිය සඳහා 2022 අප්‍රේල් මස අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර ඇත. | ව්‍යාපෘතිය විසින් අභ්‍යන්තර විගණකවරයෙකු බඳවාගත යුතුය. |

3. **භෞතික කාර්යසාධනය**

3.1 **ව්‍යාපෘති ක්‍රියාකාරකම්හි ප්‍රගතිය**

| **අංකය** | **සංරචකය** | **2021 දෙසැම්බර් 31 දිනට** | | | **කළමනාකරණයේ ප්‍රතිචාරය** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|---|---|---|---|
| | | **අපේක්ෂිත කාර්යසාධනය** | **ලභාකරගත් කාර්යසාධනය** | **ප්‍රතිශතය** | | |
| (i) | යල කන්න වැඩසටහන | හෙක්ටයාර 3676.8 | හෙක්ටයාර 1194.1 | 32.47 | එකඟවේ. වසංගත තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘතියේ සැළසුම්ගත කටයුතු ප්‍රමාදවූ අතර මේ වසරේ වැඩසටහන් කඩිනම් කිරීමට අවශ්‍ය පියවර දැනටමත් ගෙන ඇත. | කාර්යයන් කඩිනම් කිරීම සඳහා පියවර ගතයුතුය. |
| (ii) | සෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයකම දේශගුණ සුහුරු කෘෂිකර්ම (CSA) (ආදර්ශන) ගම්මාන පිහිටුවීම | ගම්මාන 39 | ගම්මාන 15 | 38.46 | | |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | පොකුරු ගම්මාන සංවර්ධනය | ගම්මාන 33 | ගම්මාන 16 | 48.48 |
| (iv) | සීඑස්ඒ පදනම්වූ මැද කන්නයේ වගා වැඩසටහන | හෙක්ටයාර 1695 | හෙක්ටයාර 721.6 | 42.57 |
| (v) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 47 සඳහා ගොවි උපකරණ ලබාදීම | ඒකක 568 | ඒකක 95 | 16.72 |
| (vi) | නිෂ්පාදක සංගම් පිහිටුවීම | සංවිධාන 14 | සංවිධාන 5 | 35.71 |
| (vii) | කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන (දියර ලීටර්) | ලීටර් 964,960 | ලීටර් 24,787 | 2.56 |
| (viii) | ආදර්ශ ගම්මාන පිහිටුවීම | 753 ප්‍රතිලාභීන් | 350 ප්‍රතිලාභීන් | 46.48 |

**3.2 ව්‍යාපෘති ක්‍රියාකාරකම් නිම කිරීම ප්‍රමාද වීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| හරිත උද්‍යාන ස්ථාපිත කිරීම, ඒඑස්සී කාර්යමණ්ඩලයේ ධාරිතා වර්ධන වැඩසටහන්, වන සත්ව ආරක්ෂක වැටවල් ඉදිකිරීම, ගොවි සංගම්හි ධාරිතා ගොඩනැගීම, ජල කළමනාකරණ කමිටු පිහිටුවීම, ජල පෝෂක ප්‍රදේශ සංවර්ධනය, තිරප්පනේ සහ අනුරාධපුර දේශගුණ සුහුරු කෘෂිකාර්මික ගොවිපල ක්ෂේත්‍ර පාසල් පිහිටුවීම, දිස්ත්‍රික් නිෂ්පාදක සම්මේලන පිහිටුවීම (PA), PA සහ Pes හි නායකයින්ගේ හැකියාවන් වර්ධනය කිරීම, අගයදාම පිළිවෙත් අනුගමනය කිරීම සඳහා PGs සාමාජිකයින් පුහුණු කිරීම, ගොවිපල ව්‍යාපාරික පාසල් ප්‍රවේශය සහ පුහුණුව සඳහා ගොවීන් බඳවා ගැනීම. පුහුණු වැඩසටහන් හා පසු අස්වනු කළමනාකරණ වැඩසටහන් පැවැත්වීම, වටිනාකම්දාම, අලෙවිකරණය සහ උපකරණ සැපයීම,සෑම දිස්ත්‍රික්කයකම අවම වශයෙන් අලෙවිකරණ සම්බන්ධතා දෙකක් සංවර්ධනය කිරීම යනාදී වැඩසටහන් 2021 වර්ෂයේ වැඩසටහන් සැලැස්ම තුළ ඇතුලත්කර ඇතත් වර්ෂය තුළ ආරම්භකර නොතිබුණි. | එකඟවේ. | වාර්ෂික වැඩ සැලැස්මට අනුකූලව කටයුතු කිරීමට පියවර ගතයුතුය. |

## 3.3 සම්පත් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන ලෙස රු. මිලියන 3,210 ක් වෙන්කර තිබුණු අතර ඉන් රු . මිලියන 1,389 ක් පමණක් භාවිතාකර තිබුණි. 2019 මැයි මස 07 වන දින සිට 2021 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ සමුච්චිත මූල්‍ය ප්‍රගතිය සලකා බැලීමේදී එය සියයට 20 ක් පමණ වේ. ඒ අනුව නිසි ව්‍යාපෘති කළමනාකරණයක් නොමැතිවීම හේතුවෙන් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය අසතුටුදායක මට්ටමක පැවති බව අවධාරණය කලයුතු අතර මේ වන විට ශ්‍රී ලංකාව මුහුණපා සිටින ආර්ථික අර්බුධය හමුවේ, නිසි අවධානයක් යොමු නොකලහොත් ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීම දුෂ්කර කාර්යයක් වනු ඇති බව තවදුරටත් අවධාරණය කරනු ලබයි. | ව්‍යාපෘතියේ ප්‍රධාන අංගය වන්නේ වැව් ප්‍රතිසංස්කරණයයි. වැව් 961 ක් මැනීමට සැළසුම්කර තිබූ අතර ඉන් වැව් 735 ක මැනීම සහ ඇස්තමේන්තු කිරීම අවසන්කර ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුව අරමුදල් යෙදවීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණ ගැටලු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතියේ කටයුතු සුමටව පවත්වාගෙන යාමට අවශ්‍ය නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ, මූල්‍ය කළමනාකරණ විශේෂඥ, දේශගුණ සුහුරු කෘෂිකර්ම විශේෂඥ, ජල කළමනාකරණ සහ අධික්ෂණ විශේෂඥ, ජල විද්‍යාඥ, අභ්‍යන්තර විගණක, ඉංජිනේරු, ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරීන් වැනි ප්‍රධාන තනතුරු සඳහා බඳවාගැනිම් කර නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම්හි හදිසි අවශ්‍යතාවය මත මූල්‍ය කළමනාකරණ විශේෂඥ තනතුර වැඩබලන පදනම මත බඳවාගෙන ඇත. ජල කළමනාකරණ සහ අධික්ෂණ විශේෂඥ, ජල විද්‍යාඥ තනතුරු සඳහා බඳවා ගැනීමේ අවශ්‍යතාවය මේ මොහොතේ මතුව නොමැති අතර අවශ්‍යවූ විට එම තනතුරු සඳහා බඳවා ගැනේ. අභ්‍යන්තර විගණක, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ සහ දේශගුණ සුහුරු කෘෂිකර්ම විශේෂඥයින් කඩිනමින් බඳවා ගැනීමට කටයුතු යොදා ඇත. | අනුමත කාරයමණ්ඩලයේ තනතුරු අවශ්‍යතාවය තක්සේරු කිරීමෙන් පසු අත්‍යවශ්‍ය ප්‍රධාන තනතුරු ප්‍රමාදයකින් තොරව පිරවිය යුතුය. |